# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

## "අස්වැසුම" අයදුම්පත පිරවීම සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ

**2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(1) වගන්තිය අනුව "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දෙවන අදියර සඳහා සුදුසු තැනැත්තන් / පවුල් හඳුනාගැනීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය තීරණය කර තිබේ. ඒ අනුව සියලුම අයදුම්කරුවන් පහත සඳහන් උපදෙස් සහ මාර්ගෝපදේශ හොඳින් කියවා අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.**

### (අ) මූලික තොරතුරු

**01.** ඔබ හෝ පවුලේ සාමාජිකයෙක් මීට පෙර අස්වැසුම - පළමු අදියර සඳහා අයදුම්පත් ලබා දී අනතුරුව නිවාස තොරතුරු සංගණනයට ලක්කර QR කේතයක් / HH අංකයක් ලබාගෙන තිබේ නම් [**ඔව්**] කොටුවෙහි [√] ලකුණ යොදන්න. [**ඔව්**] යන පිළිතුර තෝරාගත් විට ප්‍රශ්න අංක 02 සහ 03 ලෙස ඇති HH අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න. ඔබ QR කේතයක් / HH අංකයක් නොමැති නව අයදුම්කරුවෙක් නම් [**නැත**] යන කොටුවේ [√] ලකුණ යොදන්න.

04.ඔබ සහ ඔබේ පවුලේ වයස අවුරුදු 18 ට වැඩි සියළුම සාමාජිකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංකයන් සහ උපන් දිනයන් ඔබ දන්නේ නම් පමණක් [**ඔව්**] කොටුවෙහි [√] ලකුණ යොදන්න. පවුලේ එක් අයෙකුගේ හෝ ජාතික හැඳුනුම්පත් අංකය හෝ උපන්දිනය ඉදිරිපත් කළ නොහැකි නම් [**නැත**] යන කොටුවෙහි [√] ලකුණ යොදන්න.

**විශේෂ උපදෙස්**

**සියලුම අයදුම්කරුවන්ගේ සහ වයස අවුරුදු 18 ට වැඩි පවුලේ සියලුම සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ උපන්දිනය අනිවාර්යෙන්ම සඳහන් කළ යුතුය.**

- ජාතික හැඳුනුම්පත් නොමැති අයදුම්කරුවන්ට කඩිනමින් හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් විශේෂ වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වේ.

## (ආ) අයදුම්කරුගේ තොරතුරු

අයදුම්කරු යනු සුබසාධක ප්‍රතිලාභ සඳහා යම් පවුලක් / ගෘහ ඒකකයක් වෙනුවෙන් අයදුම්පතක් ඉදිරිපත් කරන තැනැත්තාය.

| |
|---|
| **විශේෂ උපදෙස්**<br><br>"අස්වැසුම" - දෙවන අදියර සඳහා අයදුම්කළ හැක්කේ පහත සඳහන් තැනැත්තන්/පවුල් කාණ්ඩ සඳහා පමණි. එනම්,<br><br>• "අස්වැසුම" පළමු අදියර සඳහා අයදුම් කිරීමට නොහැකි වූ / මඟහැරුණු සුබසාධක ප්‍රතිලාභ හිමිවිය යුතුයැයි අදහස් කරන සියලු දෙනාට<br>• "අස්වැසුම" පළමු අදියර සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළද නිවාස තොරතුරු සංගණනයට ලක්නොවූ සියලු දෙනාට |

- "අස්වැසුම" - දෙවන අදියර සඳහා පහත සඳහන් තැනැත්තන් / පවුල් කාණ්ඩ වලට අයදුම් කිරීමට නොහැකිය. එනම්,
  - දැනටමත් ප්‍රතිලාභ ගෙවීම් ලබන හෝ සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුවේ නම සඳහන් අයට
  - තොරතුරු සංගණනයට ලක්වී QR කේතයක් / HH අංකයක් සහිත සුදුසුකම්ලාභී ලැයිස්තුවට ඇතුලත් නොවූ අයට
  - දෙවන අදියරේදී ඉහත අය සඳහා තොරතුරු යාවත්කාලීන කිරීමට අවස්ථාවක් දෙනු ලැබේ.

05,07 තීරයන් / ප්‍රශ්න සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ඉල්ලා ඇති අතර ඒ තැන්වලදී එම භාෂාවෙන්ද සිංහල/ දෙමළ භාෂා වලින් ඉල්ලා ඇති තැන්වලදී තමා සන්නිවේදනය කිරීමට කැමති සිංහල හෝ දෙමල යන භාෂාවලින් එක් භාෂාවකින් සම්පූර්ණ කල යුතුය.

*ලකුණු සඳහන් සියලු තීරයෙන් / ප්‍රශ්න අනිවාර්යෙන්ම පිරවිය යුතු අතර එසේ නොවන අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

16. තීරයෙන් /ප්‍රශ්නයෙන් අයදුම්කරුගේ හෝ පවුලේ වෙනත් වැඩිහිටි සාමාජිකයෙකුගේ සක්‍රීය ජංගම දුරකථන අංකයක් සඳහන් කරන්න. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය පණිවිඩ හුවමාරු කිරීම සඳහා ජංගම දුරකථන අංකයක් අත්‍යාවශය වේ.

18. අදාළ පවුල මීට පෙර සමෘද්ධි ප්‍රතිලාභය ලබාගෙන තිබේද? යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න. එයට අදාළ පිලිතුර තෝරා [ඔව්] හෝ [නැත] යන කොටුව මත [√] යොදන්න

විශේෂ උපදෙස්

<u>එක් පවුල් ඒකකයකින් "අස්වැසුම" දෙවන අදියර සඳහා ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වඩා ඉදිරිපත් කිරීම සහ පවුලේ සාමාජිකයකු පවුල් ඒකක එකකට වැඩිගණනකට ඇතුලත් කර තිබීම ප්‍රතිලාභ අහිමිවීමට හෝ ප්‍රමාදවීමට හේතුවක් විය හැක. "පවුල් ඒකකයක්" ලෙස හඳුන්වන්නේ කුමක්ද? යන්න හොඳින් වටහා ගැනීමට පහත සඳහන් පවුල පිළිබඳ මණ්ඩල අර්ථ දැක්වීම හොඳින් කියවන්න.</u>

"පවුල යනු"

- එකට ඉවුම් පිහුම් කරන,
- එදිනෙදා ආදායම්, වියදම් එක් ඒකකයක් ලෙස එකට එක්ව සිදු කරන,
- අයදුම්කරු , ඔහුගේ / ඇයගේ මව, පියා, දරුවන්, මුණුබුරන් අවිවාහක සහෝදර, සහෝදරියන් වැනි වෙනත් යැපෙන්නන් සහිත ඒකකයකි.

(ඇ) පවුලේ සාමාජිකයන්ගේ තොරතුරු

පවුලේ සියලු සාමාජිකන්ගේ සම්පූර්ණ නම, උපන් දිනය ස්ත්‍රී පුරුෂභාවය සහ වයස අවුරුදු 18 වැඩි සියළු සාමාජිකයන්ගේ ජාතික හැඳුම්පත් අංකය සඳහන් කරන්න. පවුලේ සාමාජිකයන් 06 ට වඩා සිටිනවානම් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.

- අයදුම්කරු ලබාදුන් තොරතුරු වල සත්‍ය බව සහ නිවැරදි බව අයදුම්කරු විසින් අත්සන් යොදා සහතික කළ යුතුය. සුබසාධක ප්‍රතිලාභ පනතේ 14 වන වගන්තිය අනුව අසත්‍ය තොරතුරු සැපයීම සුබසාධක ප්‍රතිලාභ අහිමිවීමට හේතුවකි. යම් ප්‍රතිලාභයක් ඒ ආකාරයට ලබාගෙන තිබුනහොත් රජයට ආපසු අයකර ගැනීමට සිදුවන බවද සැලකිය යුතුයි. එමෙන්ම සුබසාධක ප්‍රතිලාභ පනතේ 20 වන වගන්තිය අනුව අසත්‍ය සහ වැරදි තොරතුරු ලබාදී යම් අයදුම්කරුවකු මහේස්ත්‍රාත් උසාවියේ නඩු විභාගයකින් අනතුරුව වැරදිකරුවකු වුවහොත් දඩයකට සහ / හෝ බන්ධනාගාර ගතවීමටකට යටත් වේ.

විශේෂ සටහන්

ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට කිසිඳු බාධාවක් මණ්ඩලය පනවා නොමැත.

මෙම අයදුම්පත්‍රය ඔබ විසින්ම හෝ වෙනත් සුදුසු තැනැත්තෙකුගේ තාක්ෂණික සහය ඇතිව IWMS පරිගණක පද්ධතියට ඇතුලත් කළ හැක. ඒ තුලින් සිදුවිය හැකි ප්‍රමාදයන් වලක්වා ගත හැක. ඔබ දැනටමත් මාර්ගගත ක්‍රමයට අයදුම්පතක් ඉදිරිපත් කර ඇත්නම් මෙම ආදර්ශ අයදුම්පත පුරවා භාරදීමෙන් වලකින්න. මාර්ගගත ක්‍රමයට හෝ අයදුම්පත් මගින් හෝ එක් අයදුම්කරුවකු ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි.
මෙම අයදුම්පත සම්පූර්ණ කර තමා අයත් ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයාට හෝ තමා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකයට හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරන ලද නිලධාරියාට භාරදුන් පසු භාරගත් බවට සහතික කරන ලද අයදුම්පතේ පහළ කොටස නැවත ලබා ගැනීමට සැලකිලිමත් වන්න.

ජයන්ත විජේරත්න
සභාපති / කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය